# සල්ලි හම්බ කරන්න නෙවෙයි හොරා අංකල් ගෙනාවේ

## සුමින්ද ලෝව්

**ළමා චිත්‍රපටවලට දේශීය සිනමාවේ හොඳ ඉඩක් වෙන්වී තිබෙනවා. මේ ඉඩ ආක්‍රමණය කළ අපූරු චිත්‍රපටය ලෙස'හොරා අංකල්' හඳුන්වා දෙන්න පුළුවන්. ඊඒපී මණ්ඩලයේ සිනමාශාලා තුළ සාර්ථකව තිරගත වෙන හොර අංකල් ගැන කතා කරන්න ඉදිරිපත් වුණේ ප්‍රථම සිනමා නිර්මාණයෙන්ම දරුවන්ට විශාල ආදර්ශයක් ලබාදීමට මැදිහත් වූ තරුණ නිෂ්පාදක සුමින්ද ලෝව්.**



**පාසල් දර්ශන වෙනුවෙන් හොරා අංකල් සූදානම්**

**නව නිෂ්පාදකවරයෙක් ලෙස දොරට වඩින සුමින්ද ලෝව් කියන්නේ කවුද?**

වෘත්තියෙන් මම නීති උපදේශකවරයෙක් හැටියට කටයුතු කරනවා. මීට අමතරව ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ තනතුරු කීපයක් දරනවා. මගේ OLEMI ට්‍රැවල් ආයතනයේ නිෂ්පාදනයක් හැටියට තමා හොරා අංකල් චිත්‍රපටය තිරයට එන්නේ.

**ඇයි සිනමාව තෝරගත්තේ?**

සමන් අලංකාර කියන මගේ මිත්‍රයෙක් එක්ක සම්බන්ධ වෙලා තමයි මම හොරා අංකල් නිෂ්පාදනය කරන්නේ. වෙන්නප්පුව ජෝශප් වාස් මධ්‍ය මහා විද්‍යාලයේ ඉගෙන ගන්න කාලෙත් වැඩිදුර අධ්‍යාපනය වෙනුවෙන් එංගලන්තයේ ගත කළ කාලයෙත් ළමා පරපුර වෙනුවෙන් යමක් කළ යුතුයි කියන අධිෂ්ඨානය හිතේ තිබුණා.



**ඇයි ළමා පරපුර වෙනුවෙන් මෙතරම් බැඳීමක් ඇතිවෙන්නේ...**

මූලිකවම මමත් තාත්තා කෙනෙක් වීම. මටත් ඉන්නවා හුරතල් දුවලා දෙන්නෙක්. ලොකු දුව ටයුමි සෙහාරා ලොව්. පොඩි දුව සයුමි ඔමායා ලෝව්. මගේ දුවලා දෙන්නා වෙනුවෙන් ලංකාවේ දරුවන්ට දෙයක් කරන්න ඕනේ කියලා හිතුවා.

**ඒකට හේතුවක් තියෙනවද?**

අද ළමා පරපුරට ළමා ලෝකයක් නැහැ. අද දරුවෝ මැෂින් වගේ. දෙමාපියන්ට ඕන දරුවන්ගේ ජයග්‍රහණ විතරයි. ශිෂ්‍යත්වයේ ඉහළ ලකුණු ඕනේ. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ ඉහළ සාමාර්ථ ඕනේ. එතැනට යන්න දරුවන්ව බලෙන් තල්ලු කරනවා. නමුත් දරුවන්ට ඕනේ ආදරය හා සෙනෙහස. එහෙම නැත්නම් නිදහස. බලහත්කාරයෙන් දරුවන්ගෙන් ප්‍රතිඵල ගන්න ගිහින් දරුවොත් ආත්මාර්ථකාමී වෙලා. දරුවෝ සංවේදී නැහැ. ළඟ ඉන්න යාළුවට ළෙන්ගතු නැහැ. මේකට වගකියන්න ඕනේ දෙමාපියෝ. ඒ දෙමාපියන්ට තමා මේ චිත්‍රපටයෙන් ආමන්ත්‍රණය කරන්නේ.

**දරුවන්ගේ ලෝකය දෙමාපියන් විසින් අහිමි කරලා**

**දරුවන්ගේ සෙනෙහස මාර්කට් කරන්නද ඔබ උත්සාහ ගන්නේ?**

කොහෙත්ම නැහැ. මම ලංකාවේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයෙක්. මට මාකට් කරලා සල්ලි හොයන්න බොහෝ විෂයයන් තියෙනවා. අනික චිත්‍රපටයක් කරලා විශාල ලාභයක් ලබන්න පුළුවන්ද? ලංකාවේ චිත්‍රපටයක් කිරීම තුළ ලැබෙන්නේ තෘප්තියක් හා ආස්වාදයක් පමණයි. නමුත් මට ඒ ආස්වාදය ලබන ගමන් සමාජයට හා දරුවන්ට යහපත් දෙයක් දෙන්න පුළුවන් නම් කොච්චර ලොකු පිනක්ද?

**ලක්ෂ්මන් විජේසේකර ගායනා කරපු අවසන් ගීතය තියෙන්නේ හොරා අංකල් චිත්‍රපටයේ**

**ඔබ අපේක්ෂා කරන ළමා ගුණය චිත්‍රපටයේ තිබෙනවාද?**

දරුවන් එක්ක එකට ඉඳගෙන දෙමාපියන්ට නැරඹිය හැකි චිත්‍රපටයක තිබිය යුතු ගුණය සියයට සියයක් හොරා අංකල් චිත්‍රපටයේ තිබෙනවා. විශේෂයෙන්ම මෙහි එන ගීත දෙක සඳහා අපි විශාල මුදලක් ආයෝජනය කළා. 'චූටි චූටි කුරුලු පැටව්' ගීතය සහ 'රත්තරන් හදක්' ගීත දෙකටම සංගීතය ලබාදෙන්නේ නවරත්න ගමගේ. රත්තරන් හදක් ගීතය ලක්ෂ්මන් විජේසේකර ගායනා කළ අවසන් ගීතය.

**නළු නිළියන් තෝරා ගැනීමේදී අනුගමනය කළේ කුමන ක්‍රමවේදයක්ද?**

මහේන්ද්‍ර පෙරේරා කියන්නේ ලංකාවේ ඉන්න දක්ෂතම නළුවා. මම හිතන්නේ ඔහු ඉතා සංවේදී ලෙස දරුවන් සමග ගනුදෙනු කළා. ඊට අමතරව දුලානි අනුරාධා, කුමාර තිරිමාදුර, ජනක කුඹුකගේ සහ අනුරුද්ධිකා පාදුක්කගේ තමන්ගේ කොටස හරියටම රඟපාලා තියෙනවා.

**ඔබේ දියණියන් දෙදෙනා රඟපාන්නේ නැද්ද?**

ඕක මගෙන් හැමෝම අහනවා. මම එහෙම නිෂ්පාදකවරයෙක් නෙවේ. මට ඕන වුණේ හොඳ නිර්මාණයක් එළියට දෙන්න විතරයි. හෙට ලෝකය භාරගන්න ඉන්නේ අපේ ළමා පරපුර. ඒ ළමා පරපුරට මගේ දරුවො දෙන්නත් අයිතියි. ඔවුන් භාරගන්න ලෝකයට හොඳ පණිවුඩයක් ලබාදෙන්න මට අවශ්‍ය වුණා. මගේ දරුවෝ දෙන්නා රඟපෑවට වඩා එයින් ඒ දෙන්නට ලොකු පිනක් ලැබෙන බව මම දන්නවා.

**සම නිෂ්පාදක හැටියට ඔබ හොරා අංකල් තුළින් ලාභයක් බලාපොරොත්තු වෙන්නෙ නැද්ද?**

ලාභයකට වඩා මේ පණිවුඩය සමාජගත කරන එක වටිනවා. ඇත්තටම චිත්‍රපටයට හොඳ ප්‍රතිචාර තියෙනවා. නමුත් ලාභයට වඩා ලබාදෙන පණිවුඩය දෙමාපියන්ට හා දරුවන්ගේ මනසට යනවා නම් මට ඒ ඇති.

**හොරා අංකල් බලපු අයගෙන් ලැබෙන ප්‍රතිචාර කොහොමද?**

ඉතා ඉහළ සමාජයක් මම ඇසුරු කරනවා. මගේ චිත්‍රපටය බලන්න ඒ අය ඇවිත් උන්නා. පුංචි උදහරණයක් කියන්නම්. ඉන්ටර්නැෂනල් එයාර් ලයින් ටිකටින් ඇකඩමියේ සභාපති දීපාල් පෙරේරා සහ ඔහුගේ බිරිඳ මයෝනි පෙරේරාට මම චිත්‍රපටය බලන්න ආරාධනා කළා. දීපාල් පෙරේරා කියලා තිබුණා මෙච්චර බිස්නස් තියාගෙන සුමින්දට පිස්සුද චිත්‍රපට හදන්නේ කියලා.. නමුත් චිත්‍රපටය නරඹලා ඉවර වෙලා එතුමා ඇඬුවා. ඒ වගේම ඔහුගේ බිරිඳත් බොහෝ සංවේදී වුණා. මීට අමතරව බොහෝ පාසල්වල විදුහල්පතිවරු චිත්‍රපටය බලා සංවේදී වුණා.

**පාසල් දර්ශන වෙනුවෙන් හොරා අංකල් සූදානමක් තියෙනවද?**

අපි පාසල් දර්ශන වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට චිත්‍රපටය පෙන්නුවා. කිසිදු සංස්කරණයක් නොකරම ඊට අනුමැතිය ලබා ගැනීමට අපට හැකි වෙයි. මොකද, මම මුලින්ම කිව්වෙ අහිතකර දර්ශන කිසිවක් මෙහි නැහැ කියලා. ඉතා ඉක්මනින් හොරා අංකල් පන්ති කාමරයටත් පනීවි.

ක්‍රිෂාන්ත පුෂ්පකුමාර